**විසර්ජන ශීර්ෂය-134 ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව.

2 කොටස - එක් එක් විසර්ජන ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව.

## 1 කොටස

**ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවේ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුවේ නම |
|---|---|
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුව සදහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.470,963,000 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.369,541,624 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් පිළිවෙලින් රු.90,630,976 ක් හා රු.10,790,400 ක් මළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23 ක් හා සියයට 14 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| විසර්ජන ශීර්ෂය | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන | පුනරාවර්තන | මුලධන |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 134 | ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 221,400,000 | 172,500,000 | 179,580,699 | 123,688,325 | 41,819,301 | 48,811,675 |
| 236 | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 63,878,000 | 13,185,000 | 54,036,436 | 12,236,164 | 9,841,564 | 948,836 |
| | **එකතුව** | **285,278,000** | **185,685,000** | **233,617,135** | **135,924,489** | **51,660,865** | **49,760,511** |

## 2.2 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තුවේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු. 875,055 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු. |
| ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය | 6000/0000/00/0015/0046/000 | 791,495 |
| | 6000/0000/00/0011/0570/000 | 21,300 |
| රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | 6000/0000/00/0015/0116/000 | 62,260 |
| එකතුව | | 875,055 |

## 2 කොටස
### එක් එක් විසර්ජන ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

## 1. විසර්ජන ශීර්ෂය 134 - ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 1.4 සිට 1.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 13401 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂ වල එකතුව රු.267,606 ක් විය.

**1.4 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වට්ටෝරු භාණ්ඩ ලේඛනයේ ඇතුළත් වත්කම් 166 ක් වාර්ෂික භාණ්ඩ සමීක්ෂයේදී එම වත්කම් පවතින බවට සනාථ කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**1.5 අනුකූල නොවීම්**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | - රු | |
| (අ) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | 2,659,757 | දෙන ලද තත් කාර්ය අතුරු අග්‍රිමයන් එම කාර්යය නිමවූ වහාම පියවිය යුතු වුවත්, ගෙවන ලද තත් කාර්ය අතුරු අග්‍රිම පියවීම සඳහා දින 07 ත් දින 76 ත් අතර පරාසයක කාලයක් ගතවූ අවස්ථා 27 ක් නිරීක්ෂණය විය. |
| (ආ) | 2009 ජූනි 09 දිනැති අංක DMA/2009 (01) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 03 හා 05 ඡේද | | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට හා විගණන හා කළමනාකරණ කමිටු පැවැත්වීමට කටයුතු කර නොතිබුණි. |

## 1.6 කාර්යසාධනය

### ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්

(අ) 2012 ක්‍රියාකාර සැලැස්ම අනුව භාෂා අංශය විසින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 72 ක ද්විභාෂා සහන කවුළු ස්ථාපනය කර පසු විපරම් කිරීමට සැලැසුම් කර තිබුණ ද, 2012 දෙසැම්බර් 31 දින වන විටත් සහන කවුළු ඉදිකළ බවට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 48 ක් පමණක් අමාත්‍යාංශය වෙත වාර්තා කර තිබුණි.

(ආ) ඉන්දියාවේ සිට යළි පැමිණි සරණාගතයින් ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන් 05 ක් හා පුනරුත්ථාපනය කරන ලද තරුණ කොටස් ඒකාබද්ධ කිරීමේ වැඩ සටහන් 05 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද එම වැඩසටහන් පවත්වා නොතිබුණි.

(ඇ) වැන්දඹු කාන්තාවන් බලගැන්වීමේ වැඩසටහන් 02 ක් පැවැත්වීමට සැළසුම්කර තිබුණද එක් වැඩසටහනක් හෝ පවත්වා නොතිබුණි.

(ඈ) අධ්‍යාපන ආරම්භනය තුළින් සමාජ ඒකාබද්ධතාවය ප්‍රවර්ධනය කරමේ වැඩසටහන් 03 ක් සැලසුම් කර තිබුණත් එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) වැවිලි ප්‍රජා නායකයින් හා අනෙකුත් පර්පීඩිත ජනතාව සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහන් 05 ක් පැවැත්වීම සඳහා රු.300,000 ක ප්‍රතිපාදනයක් සළසා තිබූ අතර රු.89,011 ක් වැයකරමින් එක් වැඩ සටහනක් පමණක් පවත්වා තිබුණි.

(ඊ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් යෝජිත ද්විභාෂා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 31 හි ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් සමග සංවාදාත්මක වැඩමුළු 31 ක් පැවැත්වීමට රු.1,374,500 ක් ප්‍රතිපාදන සළසා තිබුණත්, ඉන් රු.378,537 ක් වැයකර වැඩමුළු 16 ක් පමණක් පවත්වා තිබුණි.

(උ) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පළාත් පාලන නියෝජිතයින් දැනුවත් කිරීමේ සංවාදාත්මක වැඩමුළු 05 ක් පැවැත්වීමට රු.1,400,000 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර රු.358,040 ක් වැයකර එක් වැඩමුළුවක් පමණක් පවත්වා තිබුණි.

(ඌ) අර්ධ රාජ්‍ය ආයතනයන්හිද රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පිණිස ප්‍රධාන රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් සහ රාජ්‍ය භාෂා ක්‍රියාත්මක කිරීමේ නිළධාරීන් පත්කිරීමට අදාලව ගැසට් නිවේදනයක් නිකුත් කිරීමට සැලැසුම් කර තිබුණද, එය ක්‍රියාත්මක කර නොතිබුණි.

(එ) ද්විභාෂා ජනතා ක්‍රියාකාරිත්වයට සම්බන්ධ පුවත් හසුන සම්පාදනය කිරීම හා මුද්‍රණය කිරීමට රු.500,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද එය මුදුණය කර නොතිබුණි.

(ඒ) දිවයින පුරා ස්ථාපිත කර ඇති සියළුම භාෂා සංගම්වල නියෝජිතයින් 10,000 ක් ඒකරාශීකරමින් ජාතික මහා සම්මේලනය පැවැත් වීමට සැලසුම්කර තිබුණද එය ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

රාජ්‍ය ආයතනවල භාෂා පරිවර්තන කටයුතු සිදුකරදීම අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තුවක් වන රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවත්, අමාත්‍යවරයාගේ ලිපි ලේඛණ ඇතුලුව අනෙකුත් පරිවර්තන කටයුතු බාහිර පාර්ශවයන්ගෙන් සිදුකරගෙන ඒ සඳහා රු.179,748 ක් ගෙවීම් කර තිබුණි. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවෙන් ඉටුකරගත හැකි කාර්යයන්

බාහිර පාර්ශවයන්ගෙන් ඉටුකර ගැනීමට තුඩුදුන් හේතූන් මොනවාදැයි කිසිදු පිළිගත හැකි හේතුවක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 1.8 කළමනාකරණ දුර්වලතා

කොළඹ 03, ගාළු පාරේ අමාත්‍යාංශය පිහිටුවා තිබූ ගොඩනැගිල්ලේ කුලී ගිවිසුම 2010 ජනවාරි 31 දින අවසන් වී තිබූ අතර ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව, ගිවිසුම අවසන්වී මාස තුනක් ඇතුළත ආපසු ගෙවන තැන්පතුව අමාත්‍යාංශය ලබාගත යුතුව තිබුණි. එනමුත් ගිවිසුම ප්‍රකාරව මාස තුනක් ඇතුළත අදාල තැන්පතු මුදල අමාත්‍යාංශය වෙත ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා රු.5,400,000 ක් වූ තැන්පතුව 2013 දෙසැම්බර් මාසය වන විටත් අමාත්‍යාංශයට ලැබී නොතිබුණි.

## 1.9 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යා

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 11 | 02 |
| (ii) | තෘතීයික මට්ටම | 05 | 03 | 02 |
| (iii) | ද්විතීයික මට්ටම | 354 | 133 | 221 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 93 | 89 | 4 |
| | එකතුව | 465 | 236 | 229 |

## 2. විසර්ජන ශීර්ෂය 236 - රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 24 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ

ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවසථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි දැක්වෙන පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

## (අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 1994 අගෝස්තු 16 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ උපලේඛන අංක II ප්‍රකාරව ලැබීමට ඇති ණය අත්තිකාරම් ශේෂ පිළිබඳව කාල විශ්ලේෂණයක් සකස් කර නොතිබුණි.

(ii) 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 04 ඡේදය ප්‍රකාරව රජයේ සේවකයකු සඳහා ගෙවිය හැකි උපරිම ආපදා ණය ප්‍රමාණය රු.250,000 කට සීමා කළ යුතු නමුත් එම විධිවිධානවලට පටහැනිව නිලධාරියෙකුට ආපදා ණය ලබා දී තිබුණි.

## 2.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 2.4.1 අභ්‍යන්තර විගණනය

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර 2012 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් ද විගණනයක් සිදු කර නොතිබුණි.

## 2.4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය විසින් පවත්වන ලද කළමනාකරණ හා විගණන උප කමිටු රැස්වීම්වලට දෙපාර්තමේන්තුවද සහභාගී වී තිබූ අතර දෙපාර්තමේන්තුව 2012 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි.

## 2.5 කාර්යසාධනය

ක්‍රියාකාරී සැලැස්මට අනුව ද්විභාෂා ප්‍රවීණතා විභාගය සමත් සියළුම දෙනාට 2012 වර්ෂය තුළදී සහතක පත් ලබාදීමට සැලැසුම් කර තිබූ නමුත් 2007 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා විවිධ ප්‍රවීණතා මට්ටම් අනුව පැවැත්වූ විභාග වලින් සමත් වූ 26,691 දෙනෙකුගෙන් සියයට 72 කට 2013 අගෝස්තු මාසය වන විටත් සහතික පත් ලබා දී නොතිබුණි.

## 2.6 කලමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛණ සේවා මණ්ඩලය විසින් 2002 මැයි මාසයේ සිට දෙපාර්තමේන්තුවේ පුස්තකාලය අධි ශ්‍රේණියට උසස් කර තිබුණි. මෙවැනි පුස්තකාලයක් අධි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති කෙනෙකු ගෙන් හා කාර්ය මණ්ඩලය 09 කින් සමන්විත යුතු වුවත්, එම අවශ්‍යතාවයන් විධිමත් ලෙස සම්පූර්ණ නොවීම නිසා අධි ශ්‍රේණියේ පුස්තකාලයක් බවට පත් කිරීමෙන් සැලසීමට බලාපොරොත්තු වූ සේවය ලබාදීමට නොහැකි වී තිබුණි.

(ආ) නිශ්චිත වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුවට ලද මුදල් වලින් එම වැඩසටහන් පවත්වා ඉතිරිවූ මුදල අදාල ආයතන වෙත ආපසු යැවීමකින් තොරව පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 2.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 04 | 01 |
| (ii) | තෘතියික මට්ටම | 20 | 06 | 14 |
| (iii) | ද්විතියික මට්ටම | 136 | 115 | 21 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 12 | 09 | 03 |
| (v) | වෙනත් | - | 06 | - |
| | එකතුව | 173 | 140 | 39 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රාජ්‍ය ආයතන සඳහා නිල භාෂා පරිවර්තන කටයුතු සිදු කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීමක් වුවත් , සිංහල/ඉංග්‍රීසි, දෙමළ/ඉංග්‍රීසි සහ සිංහල/දෙමළ ලෙස භාෂා පරිවර්තන අධිකාරි තනතුරු 03 ක් පුරප්පාඩු වී තිබීම නිසා අපේක්ෂිත කාර්යසාධනය ලබා ගැනීමේදී දුෂ්කරතා මතු වී තිබුණි.

(ආ) වර්ෂ 10 කට අධික කාලයක සිට භාෂා විද්‍යාගාර තනතුර හා වර්ෂය අවසානය වන විට භාෂා පරිවර්තන තනතුරු 10 ක් හා භාෂා පරිවර්තන සහකාර තනතුරු 18 කුත් පුරප්පාඩු වි තිබුණි.